# <u>නිවේදනයයි</u>

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු වලට පත් කිරීම</u>**

2022.11.28 දින අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන වල ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට අයත් අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු වල පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවීමට අදාළ ලකුණු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි සංශෝධනය කර ඇති බව කාරුණිකව දන්වමි.

සංශෝධිත ලකුණු පටිපාටිය ප්‍රකාරව උක්ත පුරප්පාඩු සඳහා අයදුම්පත් යොමු කිරීමට අපේක්ෂිත ශ්‍රී ලං. අ.ප.සේ. I ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන් වේ නම් මීට ප්‍රථම අමාත්‍යාංශ වෙබ් අඩවියේ 2022.11.28 දිනැතිව පල කර ඇති අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර **2023.02.28 දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ යොමු කළ යුතු අතර 2022.11.28 දිනැති දැන්වීම ප්‍රකාරව මේ වන විටත් අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

ලකුණු පටිපාටිය හැර අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරන ලද නිවේදනය මඟින් දක්වා ඇති අනෙකුත් සියලුම කොන්දේසි නොවෙනස්ව පවතින අතර මේ වන විට අයදුම්පත් යොමු කර ඇති හා යොමු කිරීමට අපේක්ෂිත සියළු අයදුම්කරුවන් සංශෝධිත ලකුණු පටිපාටියට යටත් වන බව වැඩිදුරටත් දන්වමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එම්.එන්. රණසිංහ**
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

**2023.02.** 20